# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1988 අංක 48 දරන ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1988 නොවැම්බර් මස 30 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1988 දෙසැම්බර් මස 02 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය

මිළ : රු. 1.50 ශ. තැපැල් ගාස්තුව : රු. 1.15 ශ.

# 1988 අංක 48 දරන ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1988 නොවැම්බර් මස 30 වන දින]

එල්.ඩී.—ඕ. 49/83

## 1966 අංක 37 දරන ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

**1.** මේ පනත 1988 අංක 48 දරන ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය.

1966 අංක 37 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1966 අංක 37 දරන ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා පනතේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(ආආ) ගුවන් විදුලි යන්ත්‍ර ආනයනය කිරීමේ, විකිණීමේ, නිෂ්පාදනය කිරීමේ හෝ කොටස් එකලස් කිරීමේ ව්‍යාපාරයේ යෙදී සිටින තැනැත්තන් ලියා පදිංචි කිරීම ;".

ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (ඕ) සහ (ක) ඡේද වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන් :—

"(ඕ) ගුවන් විදුලි ප්‍රචාරක කුශලතා වර්ධනය කිරීමේ සහ වැඩි දියුණු කිරීමේ කාර්ය සඳහා, ප්‍රජාවගේ යහපත පිණිස වන්නේ යයි සංස්ථාව සලකන සියලු දේ කිරීම ;

(ක) ඉහත කී කාර්ය කිසිවක් සඳහා සංස්ථාගත කරනු ලැබූ හෝ නොලැබූ සහ ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැර යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් සමග ඒකාබද්ධ ව හෝ සහයෝගයෙන් කටයුතු කිරීම ;";

(2) එම උපවගන්තියේ (ක) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේද එකතු කිරීමෙන් :—

"(ග) ගුවන් විදුලි ග්‍රාහක යන්ත්‍ර සන්තකයේ තබා ගැනීම හා භාවිතා කිරීම සඳහා මේ පනතේ IIIඅ කොටස යටතේ බලපත්‍ර නිකුත් කිරීම හා අලුත් කිරීම සහ ඒ බලපත්‍ර නිකුත් කිරීම හා අලුත් කිරීම සඳහා නියෝජිතයන් පත් කිරීම සහ ඒ බලපත්‍ර ලබා ගෙන ඇති බවට සහ අලුත් කරගෙන ඇති බවට නිසැක කර ගැනීම ; සහ

2—ඩී 000965—7,585 (88/10)

(ච) ගුවන් විදුලි ග්‍රාහක යන්ත්‍ර ආනයනය කිරීමේ, විකිණීමේ, නිෂ්පාදනය කිරීමේ හෝ ගුවන් විදුලි ග්‍රාහක යන්ත්‍ර කොටස් එකලස් කිරීමේ යෙදී සිටින සියලු තැනැත්තන්ගෙන් ඒ යන්ත්‍ර එසේ ආනයනය කිරීම්, විකිණීම්, නිෂ්පාදනය කිරීම් හෝ එකී කොටස් එකලස් කිරීම් පිළිබඳ තොරතුරු සහ වාර්තා ලබා ගැනීම.".

ප්‍රධාන ප්‍රඥප්තියේ අලුත් 4අ වන වගන්තිය ඇතුළත් කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය, ඒ ප්‍රඥප්තියේ 4අ වන වගන්තිය වශයෙන් බලාත්මක විය යුතු ය :—

"නියෝජිතයන් පත් කිරීම.

4අ. සංස්ථාව විසින් මේ පනතේ IIIඅ කොටස යටතේ බලපත්‍ර නිකුත් කිරීමේ හා අලුත් කිරීමේ කාර්ය සඳහා සංස්ථාවේ නියෝජිතයකු ලෙස සංස්ථාගත කරනු ලැබූ හෝ නොලැබූ තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් කලින් කල පත් කළ හැකි අතර, සංස්ථාව සහ ඒ නියෝජිතයා එකඟ වන ආකාරයෙන් සංස්ථාව විසින් ඒ නියෝජිතයාට පාරිශ්‍රමික ගෙවිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය මෙයින් ඇතුළත් කිරීමෙන් :—

"(ඇඇ) 42අ වන වගන්තිය යටතේ අරමුදලට බැර කරනු ලබන සියලු මුදල් ;";

(2) ඒ වගන්තියේ (ඈ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ඈ) ගුවන් විදුලි බලපත්‍ර නිකුත් කිරීම හා අලුත් කිරීම, සඳහා ගාස්තු වශයෙන් එක් එක් වර්ෂයේදී ලැබෙන සියලුම මුදල් ;";

(3) ඒ වගන්තියේ (ඈ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ඈඈ) මේ පනතේ IIIඅ කොටස යටතේ ලියාපදිංචි කිරීමේ සහතික නිකුත් කිරීම සඳහා ගාස්තු වශයෙන් එක් එක් වර්ෂයේදී ලැබෙන සියලු මුදල් ; තව ද".

**6.** ප්‍රධාන ප්‍රඥප්තියෙහි III වන කොටසට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් කොටස මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය, ඒ ප්‍රඥප්තියෙහි III අ කොටස ලෙස බලපැවැත්විය යුතු ය :— ප්‍රධාන ප්‍රඥප්තියෙහි අලුත් III අ කොටස ඇතුළත් කිරීම.

"III අ කොටස

බලපත්‍ර නිකුත් කිරීම සහ ලියාපදිංචි කිරීම

32අ. (1) තත් කාර්යය සඳහා සංස්ථාව නිකුත් කළ බලපත්‍රයක බලය යටතේ හැර, කිසිම තැනැත්තකු විසින් අදාළ දිනයේ හෝ ඉන් පසු, යම් ගුවන් විදුලි ග්‍රාහක යන්ත්‍රයක් තම සන්තකයේ තබා ගැනීම හෝ භාවිතා කිරීම හෝ නොකළ යුතු ය. ගුවන් විදුලි ග්‍රාහක යන්ත්‍ර සන්තකයේ තබා ගැනීම සහ භාවිතා කිරීම පිළිබඳ තහනම.

(2) (1) වන උපවගන්තියේ නියමයන්—

(අ) පාඨශාලාවක, උසස් අධ්‍යාපන ආයතනයක හෝ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, අමාත්‍යවරයා විසින්, යම් ආයතනයක් තුළ ප්‍රජාවගේ යහපතට ඉවහල් වන සමාජ හෝ අධ්‍යාපනික කටයුතු සිදු කරනු ලැබීම සැලකිල්ලට ගෙන, මේ වගන්තියේ කාර්ය සඳහා නිශ්චිතව සඳහන් කරනු ලබන එවැනි ආයතනයක, යම් තැනැත්තකු විසින් ගුවන් විදුලි ග්‍රාහක යන්ත්‍රයක් තබා ගැනීම හා භාවිතා කිරීම ;

(ආ) මේ පනතේ 32ග වන වගන්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබූ සහ ඒ වගන්තිය යටතේ නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකයක් දරන යම් ගුවන් විදුලි ග්‍රාහක යන්ත්‍ර ආනයනකරුවකු, විකුණන්නකු, නිෂ්පාදකයකු හෝ කොටස් එකලස් කරන්නකු විසින් යම් ගුවන් විදුලි ග්‍රාහක යන්ත්‍රයක්, ඒ ආනයනකරු, විකුණන්නා, නිෂ්පාදක හෝ කොටස් එකලස් කරන්නා වශයෙන් තම ව්‍යාපාරය කරගෙන යන අතරතුර, තම සන්තකයේ තබා ගැනීම හා භාවිතා කිරීම ;

(ඇ) ගුවන් විදුලි ග්‍රාහක යන්ත්‍ර අලුත්වැඩියා කරන්නකු විසින් ගුවන් විදුලි ග්‍රාහක යන්ත්‍රයක්, ඒ අලුත්වැඩියා කරන්නා වශයෙන් තම ව්‍යාපාරය කරගෙන යන අතරතුර තම සන්තකයේ තබාගැනීම හා භාවිතා කිරීම;

(ඈ) ගුවන් විදුලි ග්‍රාහක යන්ත්‍රයක් සඳහා මේ කොටස යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් දරන්නකුගේ ප්‍රකාශිත හෝ ගම්‍යමාන අවසරය ඇතිව හෝ උපදෙස් මත, ඒ බලපත්‍රයේ දැක්වෙන ස්ථානයේ දී, යම් තැනැත්තකු විසින් ඒ යන්ත්‍රය භාවිතා කිරීම;

(ඉ) සංස්ථාවේ හෝ 44 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් යටතේ පිහිටුවා පවත්වාගෙන යන යම් පුද්ගලික ගුවන් විදුලි ප්‍රචාරක මධ්‍යස්ථානයක සේවයේ නියුක්තව සිටින යම් තැනැත්තකු විසින් එම සංස්ථාවේ හෝ මධ්‍යස්ථානයේ කාර්ය සඳහා යම් ගුවන් විදුලි ග්‍රාහක යන්ත්‍රයක් තම සන්තකයේ තබා ගැනීම හා භාවිතා කිරීම

සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

(3) (අ) ගුවන් විදුලි ග්‍රාහක යන්ත්‍ර කීපයක් යම් ස්ථාන වර්ගයක භාවිත කිරීමට ඉඩ ඇති බව අමාත්‍යවරයා විසින් සලකනු ලබන අවස්ථාවක, ඒ ස්ථාන වර්ගය සම්බන්ධයෙන් මේ වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු බවට ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍ය වරයා විසින් ප්‍රකාශ කළ හැකි ය.

(ආ) මේ වගන්තිය අදාළ වන ස්ථාන වර්ගයකට ඇතුළත් වන යම් ස්ථානයක අධිනිකරු විසින්, ඒ ස්ථානයේ ස්ථිකර ඇති සෑම ගුවන්

විදුලි ග්‍රාහක යන්ත්‍රයක්ම සම්බන්ධයෙන් බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කිරීම වෙනුවට ඒ ස්ථානය සම්බන්ධයෙන් බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කළ හැකි ය. මේ උපවගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන සෑම ඉල්ලුම්පත්‍රයක් ම නියමිත ගාස්තුව සමඟ ඉදිරිපත් කළ යුතු ය. ඒ ඒ ස්ථාන වර්ගයේ භාවිතා කිරීමට ඉඩ ඇති ගුවන් විදුලි ග්‍රාහක යන්ත්‍ර සංඛ්‍යාව සැලකිල්ලට ගෙන, විවිධ ස්ථාන වර්ග සඳහා විවිධ ගාස්තු ප්‍රමාණ නියම කළ හැකි ය.

(ඇ) (2) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලබන බලපත්‍ර සඳහා ඉල්ලුම් කිරීම, ඒවා නිකුත් කිරීම හා අලුත් කිරීම කෙරෙහි හා ඒ සම්බන්ධයෙන් 32ඈ, 32ආ, 32ඉ සහ 32ඊ වන වගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

(ඈ) මේ වගන්තිය යටතේ යම් ස්ථානයක් සම්බන්ධයෙන් නිකුත් කරන ලද බලපත්‍රයක් බලාත්මකව පවතින අවස්ථාවක, යම් තැනැත්තකු විසින් ඒ ස්ථානයේ ගුවන් විදුලි ග්‍රාහක යන්ත්‍රයක් තම සන්තකයේ තබා ගැනීම හා භාවිතා කිරීම 32ඈ වන වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක බලය යටතේ වන්නක් ලෙස සැලකිය යුතු ය.

මේ වගන්තියේ කාර්ය සඳහා "උසස් අධ්‍යාපන ආයතනය" යන්නෙහි 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ ඊට දී ඇති අර්ථයම ඇත.

අදාළ දින යට පෙර ගුවන් විදුලි ග්‍රාහක යන්ත්‍ර ඇතිව සිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම්.

32ආ. 32අ වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වී තිබුණ ද, අදාළ දිනයට පෙරාතුව ම ගුවන් විදුලි ග්‍රාහක යන්ත්‍රයක් සන්තකව සිටි යම් තැනැත්තකුට, අදාළ දිනයෙන් ආරම්භ වන මාස තුනක කාල සීමාවක් වෙනුවෙන් බලපත්‍රයක් ලබා නොගෙන ඒ ගුවන් විදුලි ග්‍රාහක යන්ත්‍රය සන්තකයේ තබා ගැනීමේ හා භාවිතා කිරීමේ අයිතිවාසිකම තිබිය යුතු ය.

බලපත්‍රයක් නිකුත් කිරීම.

32ඇ. (1) නියමිත විස්තර ඇතුළත් වූ ද, නියමිත ආකෘතියේ වූ ද ඉල්ලීමක් කරනු ලැබූ විට සහ නියමිත ගාස්තුව ගෙවනු ලැබූ විට, සංස්ථාව විසින් හෝ යම් නියෝජිතයකු විසින් ඉල්ලුම්කරුට ගුවන් විදුලි ග්‍රාහක යන්ත්‍රයක් සන්තකයේ තබා ගැනීම හා භාවිතා කිරීම සඳහා බලය පවරන බලපත්‍රයක් ඒ ගුවන් විදුලි ග්‍රාහක යන්ත්‍රය සඳහා නිකුත් කළ යුතු ය.

(2) මේ කොටස යටතේ යම් ගුවන් විදුලි ග්‍රාහක යන්ත්‍රයක් සම්බන්ධයෙන් බලපත්‍රයක් සඳහා වූ සෑම ඉල්ලීමක් ම නියමිත ආකෘතියෙහි ලා සංස්ථාව වෙත හෝ යම් නියෝජිතයකු වෙත ඉදිරිපත් කළ යුතු අතර, එහි නියමිත විස්තර ඇතුළත් විය යුතු ය.

(3) මේ කොටස යටතේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් ම—

(අ) නියම කරනු ලබන ආකෘතියෙහි විය යුතු ය;

(ආ) අවුරුදු එකක කාලසීමාවක් සඳහා වලංගු විය යුතු ය;

(ඇ) බලපත්‍රයේ සඳහන් කාලසීමාව ඉකුත් වූ විට අළුත් කරනු ලැබිය හැකි විය යුතු ය.

බලපත්‍රයේ නියම හා කොන්දේසි.

32ඈ. මේ කොටස යටතේ යම් ගුවන් විදුලි ග්‍රාහක යන්ත්‍රයක් සම්බන්ධයෙන් නිකුත් කරන ලද සෑම බලපත්‍රයක් ම, ඒ බලපත්‍රය භාවිතා කිරීම සහ පැවරීම සම්බන්ධයෙන් නියම කරනු ලබන නියම හා කොන්දේසිවලට යටත් විය යුතු ය.

ඉල්ලුම් පත්‍රයේ ඇතුළත් විස්තරවල යම් වෙනසක් ගැන දැනුම් දිය යුතු බව.

32ඉ. සෑම බලපත්‍රධාරියකු ම විසින් මේ කොටස යටතේ තම බලපත්‍රය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ ඉල්ලුම්පත්‍රයේ සඳහන් විස්තරවල යම් වෙනසක් සිදු වූ අවස්ථාවක, ඒ වෙනස සිදු වී දින තිහක් ඇතුළත, ඒ පිළිබඳව සංස්ථාවට හෝ නියෝජිතයාට ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

බලපත්‍ර අලුත් කිරීම.

32ඊ. (1) යම් බලපත්‍රයක් අලුත් කිරීම සඳහා නියමිත ආකෘතියෙහි වූ ඉල්ලීමක් කිරීමේ දී සහ නියමිත ගාස්තුව ගෙවනු ලැබූ විට, සංස්ථාව විසින් හෝ යම් නියෝජිතයකු විසින් 32 ඇ වන වගන්තිය යටතේ නිකුත් කළ බලපත්‍රයක් අලුත් කරනු ලැබිය හැකි අතර, අලුත් කරන ලද බලපත්‍රය එහි සඳහන් දිනයේ සිට අවුරුදු එකක කාලසීමාවක් සඳහා වලංගු විය යුතු ය.

(2) මේ කොටස යටතේ බලපත්‍රයක් අලුත් කිරීම සඳහා වූ සෑම ඉල්ලීමක්ම බලපත්‍රයෙහි සඳහන් ඉකුත් වීමේ දිනයෙන් මාස තුනක් ඇතුළත නියමිත ආකෘතියෙහි සංස්ථාව වෙත හෝ යම් නියෝජිතයකු වෙත හෝ ඉදිරිපත් කළ යුතු ය.

ගුවන් විදුලි ග්‍රාහක යන්ත්‍රයක් සඳහා බලපත්‍රයක් ලබා නොගෙන, ඒ ගුවන් විදුලි ග්‍රාහක යන්ත්‍රය සන්තකයේ තබා ගැනීම හෝ භාවිතා කිරීම පිළිබඳ සහ බල පත්‍රවල නියම සහ කොන්දේසි උල්ලංඝණය කිරීම පිළිබඳ දණ්ඩනය.

32ඌ. (1) (අ) ගුවන් විදුලි ග්‍රාහක යන්ත්‍රයක් සන්තකයේ තබා ගැනීම හෝ භාවිතා කිරීම සඳහා මේ කොටස යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් නොමැතිව, ගුවන් විදුලි ග්‍රාහක යන්ත්‍රයක්, එසේ සන්තකයේ තබාගෙන සිටින හෝ භාවිතා කරන ; හෝ

(ආ) මේ කොටස යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක යම් නියමයක් හෝ කොන්දේසියක් උල්ලංඝණය කරමින් ක්‍රියා කරන හෝ ඊට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරද කරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් දෙදහස් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාල සීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාර ගත කිරීමට නැතහොත් ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම ඔහු යටත් විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකු යම් වරදකට වරදකරු කරනු ලැබූ විට මහේස්ත්‍රාත්වරයා විසින් ඒ උපවගන්තිය යටතේ නියම කරනු ලබන යම් දඬුවමකට අමතරව,—

(අ) වරද සිදු කරන ලද්දේ යම් ගුවන් විදුලි ග්‍රාහක යන්ත්‍රයක් සම්බන්ධයෙන් ද, ඒ ගුවන් විදුලි ග්‍රාහක යන්ත්‍රය සඳහා මේ කොටස යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් තිබේ නම්, එය අවලංගු කරන ලෙස ; සහ

(ආ) වරද සිදු කරන ලද්දේ යම් ගුවන් විදුලි ග්‍රාහක යන්ත්‍රයක් සම්බන්ධයෙන් ද, ඒ ගුවන් විදුලි ග්‍රාහක යන්ත්‍රය හෝ වරද සිදු කිරීමෙහිලා හෝ ඒ වරද සිදු කිරීම සම්බන්ධයෙන් භාවිතා කරන ලද ඒ ගුවන් විදුලි ග්‍රාහක යන්ත්‍රය රාජ්‍ය සන්තක කරන ලෙස

ආඥා කළ හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ රාජ්‍ය සන්තක කරන ලද යම් ගුවන් විදුලි ග්‍රාහක යන්ත්‍රයක්, එසේ රාජ්‍ය සන්තක කිරීමෙන් පසු, එය පූර්ණ ලෙස රාජ්‍ය සන්තක වන්නේ ය. ඒ සන්තකවීම—

(අ) මහෙස්ත්‍රාත්වරයාගේ ආඥාවට විරුද්ධව අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි කාලසීමාව ඉකුත් වූ විට ; හෝ

(ආ) මහෙස්ත්‍රාත්වරයාගේ ආඥාවට විරුද්ධව අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇති අවස්ථාවක නම්, රාජ්‍ය සන්තක කිරීමේ ආඥාව ස්ථිර කරමින් හෝ අනුමත කරමින් ඒ අභියාචනය පිළිබඳව තීරණයක් කරනු ලැබූ විට

බලාත්මක විය යුතු ය.

බලපත්‍ර ගාස්තුව ගෙවා නොමැති අවස්ථාවක අධිභාරයක් අය කිරීම.

32උ. 30ඇ වන වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයෙහි සඳහන් ඉකුත්වීමේ දිනයෙන් පසු, යම් තැනැත්තකු විසින් ඒ බලපත්‍රය අලුත් කිරීම සඳහා සංස්ථාව වෙත හෝ යම් නියෝජිතයකු වෙත ඉල්ලීමක් කරන ලද අවස්ථාවක, නියමිත ප්‍රමාණයක වූ අධිභාරයක් ඉල්ලුම්කරු විසින් ගෙවනු ලැබීමට යටත්ව, සංස්ථාව විසින් හෝ ඒ නියෝජිතයා විසින් ඒ බලපත්‍රය අලුත් කළ හැකි ය ; එසේ සඳහන් කරනු ලබන උපරිම අධිභාර ප්‍රමාණය, ඒ බලපත්‍රය අලුත් කිරීම සඳහා එසේ ගෙවිය යුතු ගාස්තුවෙන් සියයට දහයක් නොඉක්මවිය යුතු ය.

ලියාපදිංචි කිරීමේ සහතිකය නොමැතිව ගුවන් විදුලි ග්‍රාහක යන්ත්‍ර ආනයනය ආදී ව්‍යාපාර වල යෙදීම තහනම් බව.

32ඌ. (1) අදාළ දිනයේ හෝ ඉන් පසු, කිසිම තැනැත්තකු යම් ගුවන් විදුලි ග්‍රාහක යන්ත්‍රයක් ආනයනය කිරීමේ, විකිණීමේ, නිෂ්පාදනය කිරීමේ හෝ එහි කොටස් එකලස් කිරීමේ ව්‍යාපාරය කරගෙන යාම සඳහා සංස්ථාව විසින් නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකයක බලය යටතේ මිස, එසේ ඒ ව්‍යාපාරය කරගෙන යාම නොකළ යුතු ය.

(2) ගුවන් විදුලි ප්‍රචාරක මධ්‍යස්ථානයක් පිහිටුවා, පවත්වාගෙන යාම සඳහා 44 වන වගන්තිය යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති යම් තැනැත්තකු විසින් ගුවන් විදුලි ග්‍රාහක යන්ත්‍රයක් ආනයනය කිරීම, විකිණීම, නිෂ්පාදනය කිරීම හෝ ගුවන් විදුලි ග්‍රාහක යන්ත්‍ර කොටස් එකලස් කිරීම සම්බන්ධයෙන් (1) වන උපවගන්තියේ නියමය අදාළ නොවිය යුතු ය.

අදාළ දිනයට පෙර ව්‍යාපාරය කරගෙන ගිය තැනැත්තන්.

32ඔ. 32ඒ. වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් ව තිබුණ ද, අදාළ දිනයට පෙරාතුව වූ දින යම් ගුවන් විදුලි ග්‍රාහක යන්ත්‍ර ආනයනය කිරීමේ, විකිණීමේ, නිෂ්පාදනය කිරීමේ හෝ එහි කොටස් එකලස් කිරීමේ ව්‍යාපාරය කරගෙන ගිය යම් තැනැත්තකුට, අදාළ දිනයෙන් ආරම්භ වන මාස තුනක කාල සීමාවක්, මේ කොටස යටතේ නිකුත් කරනු ලබන ලියාපදිංචි කිරීමේ සහතිකයක් නොමැතිව, ඒ ව්‍යාපාරය කරගෙන යාමට හිමිකම් ලැබිය යුතු ය.

ගුවන් විදුලි ග්‍රාහක යන්ත්‍ර ආනයනය කිරීම ආදී ව්‍යාපාරය කරගෙන යන තැනැත්තන් ලියාපදිංචි කිරීම.

32ඕ. (අ) ලියාපදිංචි කිරීම් සඳහා ඉල්ලීම ඉදිරිපත් කරනු ලබන්නේ යම් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් ද, ඒ ව්‍යාපාරයට අදාළව, (149 වන අධිකාරය වූ) ව්‍යාපාර නාම ආඥාපනත යටතේ නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකයේ සහතික පිටපතක් ද සමග නියමිත ආකෘතියේ වූ ඉල්ලීමක් තත් කාර්යය සඳහා ලැබුණු විට ; සහ

(ආ) නියමිත ගාස්තුව ගෙවනු ලැබූ විට, සංස්ථාව විසින්, යම් තැනැත්තකු සංස්ථාවේ ලියාපදිංචි කළ යුතු අතර, එකී ඉල්ලීම ඉදිරිපත් කරනු ලැබ ඇත්තේ යම් ගුවන් විදුලි ග්‍රාහක යන්ත්‍ර ආනයනය කිරීමේ, විකිණීමේ, නිෂ්පාදනය කිරීමේ හෝ කොටස් එකලස් කිරීමේ ව්‍යාපාරයක් සම්බන්ධයෙන් ද ඒ ව්‍යාපාරය කරගෙන යාමට ඒ තැනැත්තාට බලය දෙන ලියාපදිංචි කිරීමේ සහතිකයක් ඒ තැනැත්තාට නිකුත් කළ යුතු ය.

ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් පත්‍රය.

32ක. මේ කොටස යටතේ ලියාපදිංචි කිරීම සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයක්ම නියමිත විස්තර සහිතව නියමිත ආකෘති පත්‍රයෙහි සංස්ථාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, ඉල්ලීම ඉදිරිපත් කරනු ලබන්නේ යම් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් ද, ඒ ව්‍යාපාරයට අදාළව (149 වන අධිකාරය වූ) ව්‍යාපාර නාම ආඥාපනත යටතේ නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකයේ සහතික පිටපතක් ද ඒ සමග ඉදිරිපත් කළ යුතු ය.

ලියාපදිංචි කිරීමේ සහතිකයේ නියම සහ කොන්දේසි.

32ග. මේ කොටස යටතේ නිකුත් කරනු ලබන සෑම ලියාපදිංචි කිරීමේ සහතිකයක් ම, මෙහි උප ලේඛනයේ දක්වා ඇති නියම සහ කොන්දේසි වලට යටත් විය යුතු ය.

ලියාපදිංචි කිරීමේ සහතිකයක් නොමැතිව ගුවන් විදුලි ග්‍රාහක යන්ත්‍ර ආනයනය කිරීමේ, විකිණීමේ, ආදී ව්‍යාපාරයක් කරගෙන යාම පිළිබඳ සහ ලියාපදිංචි කිරීමේ සහතිකයක යම් නියම සහ කොන්දේසි උල්ලංඝණය කිරීම පිළිබඳ දණ්ඩනය.

32ච. (1) (අ) ගුවන් විදුලි ග්‍රාහක යන්ත්‍ර ආනයනය කිරීමේ, විකිණීමේ, නිෂ්පාදනය කිරීමේ හෝ එහි කොටස් එකලස් කිරීමේ ව්‍යාපාරය සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක් නොමැතිව ඒ ව්‍යාපාරය කරගෙන යන ; හෝ

(ආ) මේ කොටස යටතේ නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකයක යම් නියමයක් හෝ කොන්දේසියක් උල්ලංඝණය කරමින් ක්‍රියා කරන හෝ ඊට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින

යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් දෙදහස් පන්සියයක් නොඉක්ම වන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක්, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමට නැතහොත් ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම ඔහු යටත් විය යුතු ය.

(2) යම් තැනැත්තකු (1) වන උපවගන්තිය යටතේ යම් වරදක් සඳහා වදකරු කරනු ලැබූ විට, මහෙස්ත්‍රාත්වරයා විසින් ඒ උපවගන්තිය යටතේ නියම කරනු ලබන යම් දඬුවමකට අමතරව, ඔහු විසින් වරදේ බරපතලකම සැලකිල්ලට ගෙන,—

(අ) වරද සිදු කරන ලද්දේ යම් ලියාපදිංචි කිරීමේ සහතිකයක් සම්බන්ධයෙන් ද, ඒ ලියාපදිංචි කිරීමේ සහතිකය, ආඥාවේ නිශ්චිතව සඳහන් කරනු ලබන කාලයකට අත්හිටුවමින් ; හෝ

(ආ) ඒ ලියාපදිංචි කිරීමේ සහතිකය අවලංගු කරමින්

ආඥාවක් කළ හැකි ය.

සංස්ථාගත කළ හෝ නොකළ පුද්ගල මණ්ඩල විසින් කරනු ලබන වැරදි සම්බන්ධයෙන් ඇතැම් තැනැත්තන්ගේ වගකීම.

32ජ. පුද්ගල මණ්ඩලයක් විසින් මේ කොටස යටතේ වරදක් කරනු ලැබූ අවස්ථාවක—

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම්, ඒ වරද සිදු කරන ලද අවස්ථාවේ ඒ සංස්ථාවේ අධ්‍යක්ෂවරයකු, සාමාන්‍යාධිකාරීවරයකු, ලේකම්වරයකු හෝ ඊට සමාන වෙනත් නිලධරයකු වූ සෑම තැනැත්තකු ම,

(ආ) ඒ පුද්ගල මණ්ඩලය ව්‍යාපාර ආයතනයක් නම්, ඒ වරද සිදු කරන ලද අවස්ථාවේ ඒ ව්‍යාපාර ආයතනයේ හවුල්කරුවකු වූ සෑම තැනැත්තකු ම,

ඒ වරද සිදු කරන ලද්දේ තමාගේ දැනුම හෝ ගුප්තානුකූලතාව නොමැතිව බවද සියලුම අවස්ථාගත කරුණු යටතේ තමාගේ කර්තව්‍යවල ස්වභාවය සැලකිල්ලට ගැනීමේ දී තමා විසින් යෙදිය යුතු සියලු උද්‍යෝගය, ඒ වරද සිදු කිරීම වැළැක්වීම සඳහා යෙදූ බවද ඔප්පු කළහොත් මිස, ඒ වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතු ය.".

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය, ඒ ප්‍රඥප්තියේ 40අ වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :— අලුත් 40අ වන වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

"මහේස්ත්‍රාත්වරයා විසින් සෝදිසි වරෙන්තු නිකුත් කළ හැකි බව.

40අ. (1) තොරතුරු දී ඇත්තේ යම් තැනැත්තකුට විරුද්ධවද ඒ තැනැත්තා විසින්, යම් මහේස්ත්‍රාත්වරයකුගේ අධිකරණ බලසීමාව ඇතුළත යම් ස්ථානයක මේ පනතේ විධිවිධාන කඩකරමින්—

(අ) ගුවන් විදුලි ග්‍රාහක යන්ත්‍රයක් තම සන්තකයේ තබාගෙන හෝ භාවිතා කරමින් සිටින බවට ; හෝ

(ආ) ගුවන් විදුලි ග්‍රාහක යන්ත්‍ර ආනයනය කිරීමේ, විකිණීමේ, නිෂ්පාදනය කිරීමේ හෝ කොටස් එකලස් කිරීමේ ව්‍යාපාරය කරගෙන යන බවට,

දිවුරුම් මත සපයන ලද තොරතුරු මත, ඒ මහෙස්ත්‍රාත්වරයා සෑහීමට පත් වුවහොත්, ඒ ස්ථානයට ඇතුලු වී එහි සිට හමුවන යම් තැනැත්තකුගෙන් කරුණු විමසීම පිණිස සහ ඒ සඩ කිරීම සිදු කරනු ලබන්නේ යම් ගුවන් විදුලි ග්‍රාහක යන්ත්‍රයක් සම්බන්ධයෙන් ද ඒ ගුවන් විදුලි ග්‍රාහක යන්ත්‍රය තහනමට ගැනීම පිණිස සංස්ථාවේ යම් නිලධරයකුට සෝදිසි වරෙන්තුවක් ඔහු විසින් නිකුත් කළ හැකි ය.

(2) සංස්ථාවේ නිලධරයකු විසින් (1) වන උප වගන්තිය යටතේ යම් ගුවන් විදුලි ග්‍රාහක යන්ත්‍රයක් තහනමට ගත් අවස්ථාවක, ඒ ගුවන් විදුලි ග්‍රාහක යන්ත්‍රය එසේ තහනමට ගනු ලැබුවේ යම් මහෙස්ත්‍රාත්වරයකුගේ අධිකරණ බලසීමාව ඇතුලත දී ද, ඒ මහෙස්ත්‍රාත්වරයා වෙත ඒ නිලධරයා විසින් තහනමට ගැනීමේ දිනයේ සිට දින හතක කාලසීමාවක් ඇතුළත ඒ ගුවන් විදුලි ග්‍රාහක යන්ත්‍රය ඉදිරිපත් කළ යුතු අතර, එසේ ඒ ගුවන් විදුලි ග්‍රාහක යන්ත්‍රය ඉදිරිපත් කරනු ලැබූ විට, අධිකරණය විසින් ඒ ගුවන් විදුලි ග්‍රාහක යන්ත්‍රයේ භාරකාරත්වය පිළිබඳව සුදුසු යයි සලකනු ලබන ආඥාවක් කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තිය සංශෝධනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තියේ " වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්සියයක් " යන වචන වෙනුවට " වරදකරු කරනු ලැබූ විට, ප්‍රකාශිතවම අන්‍යාකාර විධිවිධාන සලස්වා තිබේ නම් මිස, රුපියල් පන්සියයක් " යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

42අ වන අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුලත් කිරීම.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුලත් කරනු ලබන අතර, එය, ඒ ප්‍රඥප්තියේ 42අ වන වගන්තිය ලෙස බල පැවැත්විය යුතු ය :—

" දඩ අය කරගත් පසු, ඉන් තුනෙන් දෙකක් සංස්ථාවට බැරකළ යුතු බව.

42අ. මේ පනත යටතේ යම් වරදක් සඳහා අධිකරණය විසින් පනවනු ලබන සියලු දඩ අය කර ගත් පසු, ඉන් තුනෙන් දෙකක් සංස්ථාවේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.".

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තිය පහත දැක්වෙන පරිදි, මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) "ගුවන් විදුලි ප්‍රචාර" යන්නෙහි අර්ථකථනයට පෙරාතුවම පහත දැක්වෙන අර්ථකථන ඇතුළත් කිරීමෙන් :—

"නියෝජිතයා" යන්න මේ පනතේ IIIඅ කොටස යටතේ වූ බලපත්‍රයකට අදාළ යම් පද සම්බන්ධයෙන් දී යෙදුනු විට, ඉන් මේ පනතේ 4අ වන වගන්තිය යටතේ සංස්ථාව විසින් ඒ නියෝජිතයා වශයෙන් පත් කරන ලද, සංස්ථාගත කරනු ලැබූ හෝ නොලැබූ යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් අදහස් වේ;

"ස්ථානය" යන්නෙන්, යම් ගොඩනැගිල්ලක් හෝ ගොඩනැගිල්ලක කොටසක්, ඊට අනුබද්ධ ඉඩම ද සහිතව, අදහස් වේ;

(2) "වැඩ සටහන" යන්නෙහි අර්ථ කථනයට ඉක්බිතිවම පහත දැක්වෙන අර්ථකථනය එකතු කිරීමෙන් :—

"ගුවන් විදුලි ග්‍රාහක යන්ත්‍රය" යන්නෙන් අවශ්‍ය තොරතුරු කැමති ස්වරූපයකින් ලබා දීම සඳහා අභ්‍යන්තර හෝ බාහිර ඒරියලයකට හෝ වෙනත් ගුවන් විදුලි සංඥා ප්‍රභවයකට සම්බන්ධ කරන ලද උපකරණයක් අදහස් වේ;

"අදාළ දිනය" යන්නෙන්, මේ පනතේ IIIඅ කොටස ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනය අදහස් වේ.

**11.** අදාළ දින සිට හා ඊට පසුව බලපත්‍ර සම්බන්ධයෙන් (192 වන අධිකාරය වූ) විදුලි සංදේශ ආඥාපනතේ ඇතුළත් විධිවිධාන, ගුවන් විදුලි ග්‍රාහක යන්ත්‍ර ආනයනය කිරීමට, විකිණීමට, නිෂ්පාදනය කිරීමට, ඒවායේ කොටස් එකලස් කිරීමට, ඒවා සන්තකයේ තබා ගැනීමට හෝ භාවිතා කිරීමට හෝ ඒ සම්බන්ධයෙන් හෝ අදාළ නොවිය යුතු ය. විදුලි සංදේශ ආඥාපනතේ ඇතැම් විධිවිධාන අදාළ නොවීම.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපලේඛනය මෙයින් එකතු කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියට අලුත් උපලේඛනයක් එකතු කිරීම.

(32ශ වන වගන්තිය)

" උපලේඛනය

32ශ වන වගන්තිය යටතේ නිකුත් කරනු ලබන ලියාපදිංචි කිරීමේ සහතිකයේ නියම නම සහ කොන්දේසි.

1. ලියාපදිංචි කිරීමේ සහතිකය අන්සතු කළ නොහැකි ය.

2. ලියාපදිංචි කිරීමේ සහතිකය අදාළ වන ව්‍යාපාර ස්ථානයේ ප්‍රකටව පෙනෙන ස්ථානයක එය ප්‍රදර්ශනය කර තැබිය යුතු ය.

3. සෑම ලියාපදිංචි කිරීමේ සහතිකපත්‍රධාරියකුම විසින් නියමිත ආකෘතියේ වූ ලේඛනයක් තබාගෙන, පවත්වාගෙන යා යුතු අතර, ඔහුගේ ව්‍යාපාරය සම්බන්ධ සෑම ගණුදෙනුවක් ම පිළිබඳව විස්තර එහි ඇතුළත් කිරීම හෝ ඇතුළත් කිරීමට සැලැස්වීම හෝ කළ යුතු ය.

4. එසේ තබාගෙන පවත්වාගෙන යනු ලබන එවැනි සෑම ලේඛනයක් ම සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තත් කාර්යය සඳහා බලය දෙන ලද යම් නිලධරයකු විසින් පරීක්ෂා කරනු ලැබිය හැකි පරිදි තබා තිබිය යුතු ය.

5. (1) තම ව්‍යාපාරය සම්බන්ධයෙන් වාර්තා හෝ වෙනත් තොරතුරු සංස්ථාවට සපයන ලෙස සංස්ථාව විසින් තමාට නියම කරනු ලැබූ විට, සෑම ලියාපදිංචි කිරීමේ සහතිකපත්‍රධාරියකුම විසින් එසේ ඒවා ඉදිරිපත් කළ යුතු ය.

(2) පෙරාතුව වූ ඡේදය යටතේ සපයන ලද සෑම වාර්තාවක් ම එහි ඇතුළත් විස්තර සත්‍ය හා නිවැරදි බවට වූ ප්‍රකාශනයක් මඟින් සත්‍යායනය කරනු ලැබිය යුතු ය.

6. සෑම ලියාපදිංචි කිරීමේ සහතිකපත්‍රධාරියකු ම විසින් ලියාපදිංචි කිරීම සඳහා ඔහු ඉදිරිපත් කළ ඉල්ලුම් පත්‍රයේ සඳහන් විස්තරවල යම් වෙනසක් සිදුවීමෙන් දින හතක් ඇතුළත ඒ වෙනස පිළිබඳව සංස්ථාවට ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

7. සෑම ලියාපදිංචි කිරීමේ සහතිකපත්‍රධාරියකු ම විසින් යම් ගණුදෙනුවක් කළේ යම් තැනැත්තකු සමග ද, එසේ නැතහොත් යම් තැනැත්තකු වෙනුවෙන් ද ඒ තැනැත්තාට තම අත්සන සහිත ලදුපතක් ඒ ගණුදෙනුව වෙනුවෙන් නිකුත් කළ යුතු අතර ඒ ලදුපතේ —

(අ) ඒ තැනැත්තාගේ නම සහ ගුවන් විදුලි ග්‍රාහක යන්ත්‍රය තබා ගන්නා ස්ථානයෙහි විස්තරය සහ ලිපිනය සහ වාහනයේ වර්ගය සහ ලියාපදිංචි අංකය ;

(ආ) ගණුදෙනුවේ ස්වභාවය ;

(ඇ) ගණුදෙනුව කළේ යම් ගුවන්විදුලි ග්‍රාහක යන්ත්‍ර සම්බන්ධයෙන් ද, ඒ යන්ත්‍රයේ හෝ යන්ත්‍රවල වර්ගය සහ සංඛ්‍යාව ;

(ඈ) ගණුදෙනුව කළ දිනය :

තවද ඔහු විසින් එවැනි සෑම ලදුපතකම පිටපතක් තබා ගත යුතු අතර, සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ තත් කාර්යය සඳහා ඔහු විසින් බලය දෙන ලද යම් තැනැත්තකු විසින් ඉල්ලා සිටින විට, එය ඉදිරිපත් කළ යුතු ය.".

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 177 කි. **(විදේශීය) රු. 236 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම** දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා **ලබාගත හැකිය.**